*සැ. යු.*- (i) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* V කොටසේ 2010 වර්ෂයේ ජූලි සිට සැප්තැම්බර් දක්වා වූ කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,811 - 2013 මැයි මස 17 වැනි සිකුරාදා - 2013.05.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 446 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 451 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | 456 |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 457 |

*සැ. යු.*- (i) මුල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

(ii) උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

(iii) ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ජූනි මස 07 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 මැයි මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු ඇබෑර්තු

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

### මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

උඩුනුවර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරුවලට ස්ථිර පදනම මත බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති උඩුනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01. | රියදුරු (iii ශ්‍රේණිය) | 01 | රු.12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160-12 x 170- රු. 18,860<br>රා. ප. ච. 06/2006 (iv)<br>පීඑල් - 3 - 2006ඒ වැටුප් කේතය 01 වැනි පියවර ආරම්භක වැටුප් පියවර සේ සැළකේ.<br>(04 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | 01. දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබිය යුතු ය.<br><br>02. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද රිය පැදවීමේ නිපුණතාවය පිළිබඳ බලපත්‍රය C, C1, D, DI, G කාණ්ඩ සඳහා ලබා තිබිය යුතු ය.<br><br>දිවා රාත්‍රී කාලයේ සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් යෝග්‍ය තත්ත්වයෙන් සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.<br><br>අවම උස අඩි 05ක් විය යුතු ය.<br><br>මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය.<br><br>03. රියදුරකු ලෙස අවම වශයෙන් අවුරුදු 02ක පළපුරුද්දක් ලබා තිබිය යුතු ය. |
| 02. | විදුලි කාර්මික (iii ශ්‍රේණිය) | 01 | රු.12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 12 x 170 - රු.18,860<br>රා. ප. ච. 06/2006 (iv)<br>පීඑල් - 2 - 2006ඒ වැටුප් කේතය 01 වැනි පියවර ආරම්භක වැටුප් පියවර සේ සැළකේ.<br>(04 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | 01. දෙවරකට නොවැඩි වාර ගණනදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයන් 06කින් සාමාර්ථය ලබා තිබිය යුතු ය.<br><br>02. අ. වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 2 වැනි මට්ටමේ (NVQ 2) හෝ 3 වැනි මට්ටමේ (NVQ 3) සහතිකය ලබා තිබීම ;<br><br>හෝ<br><br>ආ. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ;<br><br>හෝ<br><br>ඇ. ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br><br>හෝ |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| | | | | *ඈ.* ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>*ඉ.* ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ;<br>*හෝ*<br>*ඊ.* තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.<br>03. විදුලි කාර්මිකයකු ලෙස අවම වශයෙන් අවුරුදු 02ක පළපුරුද්දක් ලබා තිබිය යුතු ය. |
| 03. | අදාහනාගාර ක්‍රියාකරු (iii ශ්‍රේණිය) | 01 | රු.12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 12 x 170 - රු.18,860<br>රා. ප. ච. 06/2006 (iv)<br>පීඑල් - 2 - 2006ඒ වැටුප් කේතය 01 වැනි පියවර ආරම්භක වැටුප් පියවර සේ සැළකේ.<br>(04 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | 01. දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබිය යුතු ය.<br>02. *අ.* වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 2 වැනි මට්ටමේ (NVQ 2) හෝ 3 වැනි මට්ටමේ (NVQ 3) සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>*ආ.* කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ;<br>*හෝ*<br>*ඇ.* ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>*ඈ.* ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>*ඉ.* ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ;<br>*හෝ* |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| | | | | ඊ. තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.<br><br>03. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 02ක පලපුරුද්දක් ලබා තිබිය යුතු ය. |
| 04. | නළ ලිං කාර්මික (iii ශ්‍රේණිය) | 01 | රු.12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 12 x 170 - රු.18,860<br>රා. ප. ච. 06/2006 (iv)<br>පීඑල් - 2 - 2006ඒ වැටුප් කේතය 01 වැනි පියවර ආරම්භක වැටුප් පියවර සේ සැළකේ.<br>(04 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | 01. දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබිය යුතුය.<br><br>02. (අ) .වෘත්තියට අදාලව ජාතික වෘත්තීය සුදුසුකම් 2 වැනි මට්ටමේ (NVQ 2) හෝ 3 වැනි මට්ටමේ (NVQ 3) සහතිකය ලබා තිබීම ;<br><br>*හෝ*<br><br>(ආ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ;<br><br>*හෝ*<br><br>(ඇ) ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br><br>*හෝ*<br><br>(ඈ) ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br><br>*හෝ*<br><br>(ඉ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br><br>(ඊ) තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.<br><br>03. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 02ක පලපුරුද්දක් ලබා තිබිය යුතු ය. |

| අනු. අංකය | .තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 05. | ආයුර්වේද ඖෂධ සංයෝජක (iii ශ්‍රේණිය) | 01 | රු.12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 12 x 170 - රු.18,860<br>රා. ප. ච. 06/2006 (iv)<br>PL- 2 - 2006A වැටුප් කේතය<br>01 වැනි පියවර ආරම්භක වැටුප් පියවර සේ සැළකේ.<br>(04 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | 01. දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබිය යුතු ය.<br>02. නාවින්න/කෙරමිණිය වික්‍රමාආරච්චි ආයුර්වේද විද්‍යාලයක හෝ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පිළිගත් වෙනත් ආයුර්වේද බෙහෙත් ශාලාවක/රෝහලක හෝ විද්‍යාලයක ඖෂධ සංයෝජනය පිළිබඳ වසරකට නොඅඩු කාලසීමාවක පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම අමතර සුදුසුකමක් සේ සැළකේ.<br>03. රජයේ හෝ පළාත් සභාවේ හෝ පළාත් පාලන ආයතනයක ආයුර්වේද මධ්‍යස්ථානයක ඖෂධ සංයෝජනය පිළිබඳ වසර 01කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතු ය. (පුහුණු කාල සීමාව යටත් පිරිසෙයින් වසර 02ක් වත් තිබිය යුතුය) |
| 06. | මාර්ග කම්කරු (iii ශ්‍රේණිය) | 05 | රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 12 x 160 - රු.17,600<br>(රා. ප. ච. 06/2006 iv)<br>PL - 1 - 2006A වැටුප් කේතය<br>01 වැනි වැටුප් පියවර ආරම්භක පියවර වශයෙන් සැළකේ.<br>(04 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | 01. අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය (9වසර) සමත්වී සිටිය යුතු ය. |
| 07. | සෞඛ්‍ය කම්කරු (iii ශ්‍රේණිය) | 06 | රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 12 x 160 - රු. 17,600<br>(රා. ප. ච. 06/2006 iv)<br>PL - 1 - 2006A වැටුප් කේතය<br>01 වැනි වැටුප් පියවර ආරම්භක පියවර වශයෙන් සැළකේ.<br>(04 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | 01. අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය (9වසර) සමත්වී සිටිය යුතු ය. |
| 08. | පුස්තකාල සහායක (iii ශ්‍රේණිය) | 02 | රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 12 x 160 - රු.17,600<br>(රා. ප. ච. 06/2006 iv)<br>PL - 1 - 2006A වැටුප් කේතය<br>01 වැනි වැටුප් පියවර ආරම්භක පියවර වශයෙන් සැළකේ.<br>(04 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | 01. දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල, දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය. |
| 09. | ආදාහනාගාර සහායක (iii ශ්‍රේණිය) | 01 | රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 12 x 160 - රු.17,600<br>රා. ප. ච. 06/2006 (iv)<br>PL - 1 - 2006A වැටුප් කේතය<br>01 වැනි වැටුප් පියවර ආරම්භක පියවර වශයෙන් සැළකේ.<br>(04 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | 01. දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල, දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය. |

02. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

1. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වසය අවු. 18ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතු ය. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර/අනියම් තනතුරු දරන සේවකයන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

2. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික විය යුතු ය.

3. අයදුම්කරු/කාරිය උඩුනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යටත් පිරිසෙන් අවුරුදු 05ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතු ය.

4. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.

5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙක් වී දඬුවම් ලැබූවෙක් නොවිය යුතු ය.

6. රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූවෙක් හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය.

7. උඩුනුවර ප්‍රදේශීය සභා කාර්යාලයේ දැනට ආදේශක පදනම මත සේවය කරන සේවකයන්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

8. අයදුම්කරුවන් තනතුර ඉදිරියෙන් දක්වා ඇති අවම අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. වැන්දඹු හා අනත් දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.
3. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන්නේ ය.
4. මෙම තනතුර පළාත් රාජ්‍ය සේවයට අයත්වන අතර, පත්වීම අදාළ පළාත් පාලන ආයතනයට පමණක් වේ.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :*

1. අවශ්‍යතාවය මත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.
2. අයදුම්පත් සමග පහත සඳහන් සහතික වල පිටපත් අමුණා එවිය යුතු වන අතර, මුල්පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු ය.

    * උප්පැන්න සහතිකය
    * අධ්‍යාපන සහතික
    * පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම සේවක සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ)
    * වෘත්තිය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික තිබේ නම්, එම සහතික (රජයේ/පළාත් පාලන සේවයේ නියුක්ත වූවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය)

3. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

05. *අයදුම්පත් :*

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2013.06.17 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලේකම්, උඩුනුවර ප්‍රාදේශීය සභාව, ගෙලිඔය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය.

2. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. මෙම අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතරතුර හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීමේ සියලු බලතල ප්‍රදේශීය සභාවේ ලේකම් සතුවේ.

ආර්. එච්. එම්. අයි. මැණිකේ,
ලේකම්,
උඩුනුවර ප්‍රාදේශීය සභාව.

2013 අප්‍රේල් මස 29 වැනි දින,
ගෙලිඔය,
උඩුනුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*උඩුනුවර ප්‍රාදේශීය සභාව*

*මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ...................................... තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. (i) අයදුම්කරුගේ මුලකුරු සමග නම :————————————.

(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම් :————————————.

02. ස්ථිර ලිපිනය :————————————.

03. (i) උපන් දිනය :————————————.

(ii) 2013.06.17 දිනට වයස :අවුරුදු:————————.මාස:————————. දින:————————.

04. ස්ත්‍රී/පුරුෂභාවය :————————————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :————————————.

06. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද ? (පරම්පරාවෙන් ද නැතහොත් ලියාපදිංචියෙන්ද යන්න සඳහන් කරන්න):————————————.

07. අධ්‍යාපන සුදුසුකම් :————————————.

08. ඔබ දැනට උඩුනුවර ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තර:————————————.

09. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :————————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව දැන ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත්, දනිමි.

————————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*
*(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි)*

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත් තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කිරීමට එකඟ වන බවත් දැනට ........................................................................ වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

————————————,
ආයතන ප්‍රධානියාගේ සහතිකය.

දිනය :————————————.

05-448

---

# පළාත් පාලන නිවේදන

**වෙරුගල් ප්‍රාදේශීය සභාව**

1987/15 දරන ප්‍රාදේශීය සභා පනත

**බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු - 2013**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1695 දරන 2011 පෙබරවාරි මස 25 වැනි දිනැති ගැසට් නිවේදනයේ IV(ආ) වැනි කොටසේ විවිධ දැන්වීම් පිටු අංක 722 සිට පිටු අංක 727 දක්වා උපවගන්ති I සිට VIII දක්වා පළ කරන ලද ගාස්තුන් 2013 ජනවාරි මස 01 වැනි දින සිට අයකරන බව මෙහි පිටු අංක 726 හි සඳහන් කර ඇති බෝට්ටු මගින් ප්‍රවාහනය කරන පාපැදි සහ යතුරු පැදිවලට අයකරන ගාස්තු අවලංගු කර, එම සේවය නොමිලේ ලබා දෙන බව 2013.01.04 වැනි දින පැවති විශේෂ රැස්වීමේ දී අංක 06 යෝජනාව අනුව සම්මත කර ඇති බව දැනුම් දෙමි.

එස්. විජයකාන්ද,
සභාපති,
වෙරුගල් ප්‍රාදේශීය සභාව.

2013 අප්‍රේල් මස 18 වැනි දින,
ඊච්චලම්පත්තු.

05-328

## යටවත්ත ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

මා විසින් 2012.11.23 වැනි දින අංක 1786 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV ආ කොටසේ පළ කරන ලද යටවත්ත ප්‍රාදේශීය සභාව සතු පාරවල් පිළිබඳ නිවේදනයේ සඳහන් පහත උපලේඛනයේ දැක්වෙන සියලුම පාරවල් යටවත්ත ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට අනුව මෙයින් දැනුම් දෙමි.

එච්. ඩී. ලාල් අත්තනායක,
සභාපති,
යටවත්ත ප්‍රාදේශීය සභාව.

### උපලේඛනය

| | | |
|---|---|---|
| ග්‍රාම නිලධාරී වසම | - | අඹන්පොල |
| මාර්ගයේ නම | - | සිද්ධප්පල ප්‍රධාන මාර්ගයේ මල්මීවල ගෙදර නිවස අසලින් ආරම්භ වී පරලවෙල කොල පාගන ගල ආසන්නයෙන් කුඹුර දක්වා දිවෙන අතු පාර |
| මාර්ගයේ දිග | - | මීටර් 201.22 |
| මාර්ගයේ පළල | - | මීටර් 2.44 |

**මායිම් :**

| *දකුණු දෙසට* | *වම් දෙසට* |
|---|---|
| ඩී. එම්. යූ. ජී. ටිකිරිබණ්ඩාගේ ගොඩ ඉඩම | එම්. ජී. මුතුබණ්ඩාගේ ගොඩ ඉඩම |
| ඩී. එම්. පී. ජී. පිංචි අම්මාගේ ගොඩ ඉඩම | වී. අයි. එස්. නරසිංහගේ ගොඩ ඉඩම |
| ඩී. එම්. එම්. බී. දසනායකගේ ගොඩ ඉඩම | ඊ. එම්. පී. ඒ. පුංචි බණ්ඩාගේ ගොඩ ඉඩම |

| | | |
|---|---|---|
| ග්‍රාම නිලධාරී වසම | - | මඩදෙණිය |
| මාර්ගයේ නම | - | මාතලේ-මාතලාපිටිය මාර්ගයේ නන්දන විදුහල අසලින් ආරම්භ වී මඩදෙණිය පාර දක්වා දිවෙන මාර්ගය |
| මාර්ගයේ දිග | - | මීටර් 700 |
| මාර්ගයේ පළල | - | මීටර් 2.44 |

**මායිම් :**

| *දකුණු දෙසට* | *වම් දෙසට* |
|---|---|
| රජයේ විදුහල් භූමිය | රජයේ විදුහල් භූමිය |
| ජී. ඩබ්. බබානිස්ගේ ඉඩම | එන්. ඒ. චමින්ද ජානක පෙරේරාගේ ගොඩ ඉඩම |
| ජී. ඩබ්. සුනිල් ශාන්තගේ ගොඩ ඉඩම | පී. ජී. ආරියවංශගේ ගොඩ ඉඩම |
| ඩබ්. ජී. ජයවීරගේ ගොඩ ඉඩම | ඩබ්. ජී. ජයවීරගේ ගොඩ ඉඩම |
| ජී. ජී. වික්‍රමසූරියගේ කුඹුරු ඉඩම | පංසලේ කුඹුර |
| පහල වලව්වේ කුඹුර | ජී. ඩබ්. ජී. කමල් රාජපක්ෂගේ කුඹුර |
| පී. ජී. සෝමපාලගේ කුඹුර | එච්. ඩී, සමරනායකගේ කුඹුර |
| එන්. ඒ. චන්න පෙරේරාගේ කුඹුර | ආර්. ජී. සුනිල් විජේසිංහගේ ගොඩ ඉඩම |
| එච්. ඩී. සමරනායකගේ කුඹුර | ඊ. ජී. ගුණසිංහ } හවුල් ඉඩම |
| ජී. ඩී. ජී. නන්දදේවගේ කුඹුර | ඊ. ජී. ජයසිංහ } හවුල් ඉඩම |
| ඩබ්. ඩී. ඒ. ප්‍රේමතිලකගේ කුඹුර | ඊ. පී. කරුණාසිංහ } හවුල් ඉඩම |
| | එච්. ඩී. හරමානිස්ගේ ගොඩ ඉඩම |
| | ඩබ්. ඩී. ඒ. ප්‍රේමතිලකගේ ගොඩ ඉඩම |

| | | |
|---|---|---|
| ග්‍රාම නිලධාරී වසම | - | පමුණුව |
| මාර්ගයේ නම | - | කොස්කොටුව සිට පමුණුව හරහා කොටඹේ හන්දියට යන මාර්ගයෙන් හැරී පමුණුව ඉහලගම අරඹේ ළිඳ ළගට යන මාර්ගය |
| මාර්ගයේ දිග මීටර් | - | 136 |
| මාර්ගයේ පළල | - | 2.44 |

**මායිම්**

| දකුණු දෙසට | වම් දෙසට |
|---|---|
| 1. බී. ජී. සුවාරිස්ගේ ගොඩ ඉඩම | 1. ටී. එම්. ගුණතිලකගේ ගොඩ ඉඩම |
| 2. ටී. ජී. පියසේනගේ ගොඩ ඉඩම | 2. බී. ජී. ආරියවතීගේ ගොඩ ඉඩම |
| 3. බී. ජී. විජයකාන්තිගේ ගොඩ ඉඩම | 3. අයි. ජී. ගුනේරිස්ගේ ගොඩ ඉඩම |
| | 4. බී. ජී. විජයකාන්තිගේ ගොඩ ඉඩම |

ග්‍රාම නිලධාරි වසම - මාතලාපිටිය

මාර්ගයේ නම - කුඩෑල සිට මොරගහමුදුන දක්වා යන අතුරු මාර්ගය
මාර්ගයේ දිග - මීටර් 200
මාර්ගයේ පළල - මීටර් 2.44

| දකුණු දෙසට | වම් දෙසට |
|---|---|
| 1. යූ. එස්. ඩී. වික්‍රමසිංහ මයාගේ ගොඩ ඉඩම | 1. යූ. එස්. ඩී. වික්‍රමසිංහ මයාගේ ගොඩ ඉඩම |
| 2. එස්. ඩී. ජී. මාග්‍රට් මියගේ ගොඩ ඉඩම | 2. එච්. ජී. විජේසිංහ මයාගේ ගොඩ ඉඩම |
| 3. එච්. ජී. විජේසිංහ මයාගේ ගොඩ ඉඩම | 3. ඊ. එල්. ජී. ජයවීර මයාගේ ගොඩ ඉඩම |
| 4. එච්. ඩී. ලාල් අත්තනායක මයාගේ ගොඩ ඉඩම | |

ග්‍රාම නිලධාරි වසම - මැදියාපොල

මාර්ගයේ නම - යටවත්ත ගාඩන්ස් මාර්ගය
මාර්ගයේ දිග - මීටර් 500
මාර්ගයේ පළල - මීටර් 3.66

| දකුණු දෙසට | වම් දෙසට |
|---|---|
| 1. පී. යාපා බණ්ඩාර මයාගේ ගොඩ ඉඩම | 1. ඩබ්. එම්. පී. ජී. වීමලා කුමාරිහාමිගේ ගොඩ ඉඩම |
| 2. එස්. ඩබ්. ඩබ්. පී. විතානගේ ගොඩ ඉඩම | 2. ජී. ජී. සරත් බණ්ඩාගේ ගොඩ ඉඩම |
| 3. එච්. ඒ. වසන්ත කුමාරගේ ගොඩ ඉඩම | 3. කේ. ජී. ඒ. ප්‍රදීප් කුමාරගේ ගොඩ ඉඩම |
| 4. පී. ජස්ටි ක්‍රිස්ටි ගේ ගොඩ ඉඩම | 4. ඊ. එම්. පී. ජී. ජයන්ත ඒකනායකගේ ගොඩ ඉඩම |
| 5. ජී. එච්. සිලි නෝනාගේ ගොඩ ඉඩම | 5. එස්. පී. දිනූෂා උපුල් ප්‍රනාන්දුගේ ගොඩ ඉඩම |
| 6. ආර්. ඩබ්. ඉන්ද්‍රා කුමාරිහාමිගේ ගොඩ ඉඩම | 6. ඒ. එල්. කෝසල ලියනගේ ගේ ගොඩ ඉඩම |
| | 7. පී. ආර්. බී. ජිනදාසගේ ගොඩ ඉඩම |

මාර්ග විස්තර - යටවත්ත ප්‍රාදේශීය සභාව

ග්‍රාම නිලධාරි වසම - දීවිල්ල
පාරේ නම - යේලක්කරය පාලම අසලින් ආරම්භ වී කමත ලඟින් රේස්පිටිය දක්වා දිවෙන මාර්ගය
මාර්ගයේ දිග - මීටර් 231.7
මාර්ගයේ පළල - මීටර් 2.44

**මායිම්**

| දකුණු දෙසට | වම් දෙසට |
|---|---|
| 1. සකිරියා මුදලාලිගේ ගොඩ ඉඩම | 1. සකිරියා මුදලාලිගේ පොල් කඩය |
| 2. දයානන්ද මහතාගේ ගොඩ ඉඩම | 2. ජී. ඩබ්. ගුණවර්ධන මහතාගේ නිවස |
| 3. සකිරියා මුදලාලිගේ ගොඩ ඉඩම | 3. ජී. ඩබ්. සේනාරත්න මහතාගේ නිවස හා කමත |
| 4. වඩුඩ් හා සකිරියා මුදලාලිගේ කුඹුරු ඉඩම | 4. සකිරියා මුදලාලිගේ කුඹුර |
| | 5. පී. ජී. ප්‍රේමදාස මහතාගේ ඉඩම |

05-337

## රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව

### මදුරුවන් සහ රෝගී කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව පිළිගැනීම

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව විසින් 2013 ජනවාරි මස 10 වැනි දින පවත්වන ලද රැස්වීමේදී තීරණ අංක 03.:03 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වයි. එම්. කරු වීරරත්න,
සභාපති,
ප්‍රාදේශීය සභාව - රිදීමාලියද්ද.

2013 ජනවාරි මස 10 වැනි දින,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා කාර්යාලය.

**යෝජනාවයි**

"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වන වගන්තිය යටතේ, ඌව පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව අංක 1678/4 හා 2010.11.02 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලද්දාවූ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා"

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 93 වන වගන්තිය සහ 126 වැනි වගන්තිය 9 වන උප වගන්තිය ලැබී ඇති බලතල ප්‍රකාරව රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිළිගැනීමටත්, ක්‍රියාත්මක කිරීමටත් බල පැවැත්විය යුතු අතුරු ව්‍යවස්ථාව වශයෙන් මෙම යෝජනාව *ගැසට් පත්‍රයේ* පලකරන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

මෙම සම්මත අතුරු ව්‍යවස්ථාව අර්ථ නිරූපනය කිරීමේදී සම්මත අතුරු ව්‍යවස්ථාවේ යෙදෙන සභාව, සභාපතිවරයා සහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය යන යෙදුම්වලින් රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව, රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ සභාපති සහ රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අදහස් වන්නේය.

05-323/3

---

## රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව

### ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීම

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව විසින් 2012 දෙසැම්බර් මස 12 වැනි දින පවත්වන ලද රැස්වීමේදී තීරණ අංක 02 හා 03 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වයි. එම්. කරු වීරරත්න,
සභාපති,
ප්‍රාදේශීය සභාව - රිදීමාලියද්ද.

2013 ජනවාරි මස 10 වැනි දින,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා කාර්යාලය.

**යෝජනාවයි**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සමඟ කියවිය යුතු, 261 අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර ඌව පළාතේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2012.10.05 වන දින අංක 1778/45 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ප්‍රාදේශීය සභා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 93 වගන්තිය සහ 126 වැනි වගන්තියේ 9 වැනි උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිළිගැනීමටත්, ක්‍රියාත්මක කිරීමටත් බලපැවැත්විය යුතු අතුරු ව්‍යවස්ථාව වශයෙන්, මෙම යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරන දින සිට ක්‍රියාත්මක කිරීමටත් පිළිගැනීමටත්, ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

මෙම සම්මත අතුරු ව්‍යවස්ථාව අර්ථ නිරූපනය කිරීමේදී සම්මත අතුරු ව්‍යවස්ථාවේ යෙදෙන සභාව, සභාපතිවරයා, ලේකම්වරයා සහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය යන යෙදුම් වලින් රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව, රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ සභාපති, රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් සහ රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අදහස් වන්නේය.

05-323/2

---

**රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව**

අක්කර බදු පැනවීම-2013

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව විසින් 2012 දෙසැම්බර් මස 12 වැනි දින පවත්වන ලද රැස්වීමේදී තීරණ අංක 02.02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

වයි. එම්. කරු වීරරත්න,
සභාපති,
ප්‍රාදේශීය සභාව - රිදීමාලියද්ද.

2013 ජනවාරි මස 10 වැනි දින,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(3) වැනි වගන්ති ප්‍රකාරව රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ ද 1989.04.28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විෂය භාර අමාත්‍යවරයා වෙත ලැබී ඇති බලතල අනුව අක්කර බදු නියම කිරීම හා අය කිරීමේ කාර්යය සඳහා විශේෂ ප්‍රදේශයක් ලෙස රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ප්‍රකාශයට පත් කර ඇති බැවින් රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි එක් එක් ඉඩම් හෙක්ටයාර මත පහත දක්වා ඇති අනු ප්‍රමාණය මත 2013 වර්ෂය සඳහා අක්කර බදු නියම කිරීම සහ අය කිරීමට යෝජනා කරන්නීය.

තවද මෙම අක්කර බද්ද අනු පිළිවෙලට මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන් හෝ ඊට පෙර කාර්තු හතරකදී සමාන අයුරින් ගෙවිය යුතුය.

| *ඉඩම් ප්‍රමාණය* | *බදු අය ප්‍රමාණය - වර්ෂයට*<br>*රු. ශ.* |
|---|---|
| ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහකට අඩු නමුත් හෙක්ටයාර් එකකට නොඅඩු වන අවස්ථාවක | 50 0 |
| ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වන අවස්ථාවක හෙක්ටයාරයක් සඳහා | 10 0 |

මෙම අක්කර බද්ද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(7) වගන්ති ප්‍රකාරව 2013 වර්ෂය සඳහා ජනවාරි මස 31 දින හෝ ඊට ප්‍රථම ගෙවුවහොත් 10%ක වට්ටමක් ද වාරික වලින් ගෙවූ අවස්ථාවක බද්දේ වාරිකය අයවිය යුතු කාර්තුවක කාල සීමාව තුළ පළමු මාසය ඇතුළත ගෙවුවහොත් ඒ වාරිකයේ ප්‍රමාණයෙන් 5%ක වට්ටමක් ද ප්‍රදානය කරනු ලැබේ.

05-323/1

---

**පොදු සුසාන භූමි සහ පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥා පනතේ II පරිච්ඡේදයේ 5(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වන නීතිඥ අතුල විජේසිංහ වන මා විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි පහත උපලේඛනයේ දැක්වෙන සුසාන භූමි පොදු සුසාන භූමි සහ පුද්ගලික සුසාන භූමි පිළිබඳ 1946 අංක 57 දරන ආඥා පනතේ II පරිච්ඡේදයේ 5(1) වගන්තිය යටතේ මලමිණී වැලලීම හා ආදාහනය කිරීම පිණිස පොදු සුසාන භූමියක් වශයෙන් ප්‍රකාශයට පත් කරමි.

නීතිඥ අතුල විජේසිංහ,
වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය.

2013 අප්‍රේල් මස 19 වැනි දින,
වයඹ පළාත් සභාවේ දී ය.

| සුසාන භූමියේ නම | | පිහිටීම | පිඹුරුපත් අංකය හා දිනය | ඉඩමේ ප්‍රමාණය | මායිම් |
|---|---|---|---|---|---|
| 01. | මතව පොදු සුසාන භූමිය | මතව | 82/2013 2013.03.05 | අ.0,රූ.03, පර්.24.0 | උතුරට : රඹුක්කන මහා මාර්ගය<br>දකුණට : කොටස්කර විකුණන ලද ඉඩම<br>නැගෙනහිරට : අඩි 30ක් පළල මාර්ගය<br>බටහිරට : අඩි 20ක් පළල මාර්ගය |
| 02 | ඉඳුල්ගොඩ පොදු සුසාන භූමිය | ඉඳුල්ගොඩ | 83/2013 2013.03.05 | අ.0,රූ.2, පර්.10.1 | උතුරට : අංක කු1315 දරන මූලික පිඹුරේ අංක 63 දරන කැබැල්ල<br>දකුණට : කටුපිටිය - මල්ලවපිටිය මාර්ගය<br>නැගෙනහිරට : අංක කු1315 දරන මූලි ක පිඹුරේ අංක 63 දරන කැබැල්ල<br>බටහිරට : අංක කු 1315 දරන මූලික පිඹුරේ අංක 64 දරන කැබැල්ල |
| 03 | මාස්පොත පොදු සුසාන භූමිය | මාස්පොත | 95/2013 2013.03.11 | අ.0, රූ.3, පර්. 8.5 | උතුරට : ඩබ්. ඩී අශෝක පියදාස හිමිකම් කියන ඉඩම<br>දකුණට : කුඩාගල්ගමුවේ සිට පුත්තලම් මාර්ගයට පිවිසෙන මාර්ගය<br>නැගෙනහිරට : ප්‍රාදේශීය සභා මාර්ගය<br>බටහිරට : ඩබ්. පී. නාලක හිමිකම් කියන ඉඩම. |

05-458

---

**වැලිගම ප්‍රාදේශීය සභාව**

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වාහළ කනංකේ දකුණ ග්‍රාම සේවා කොට්ඨාසයේ පිහිටි දිවෙලගොඩ පාරෙන් පටන්ගෙන අඩිහගොඩ වත්ත, පාලුවත්ත දක්වා දිවෙන පහත උපලේඛනයේ සඳහන් මාර්ගය අඩිහගොඩ වැවලගේ වත්ත ලෙස 2012.05.24 වැනි දින වැලිගම ප්‍රාදේශීය සභාවේ පැවැති මාසික සභා රැස්වීමේදී තීරණ අංක 04:0:03 යටතේ යෝජනා ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත වූ අතර එම පාර පොදු මහජනතාවගේ ගමනාගමනයට සුදුසු පාරක් ලෙසට ප්‍රකාශයට පත් කරනු ලැබේ.

උපලේඛනය

පාරේ දිග : මීටර් 294
පාරේ පළල : මීටර් 3.5
එම පාර වම : කුඩහිල්ලවත්ත ඕවිට ගෙදර දොලේ ගෙදර ගඟුලහ කොරටුව
එම පාර දකුණ : කුඹුර සහ ඇල රක්ෂිතය

පුෂ්ප කුමාර බැට්ටගේ,
සභාපති,
වැලිගම ප්‍රාදේශීය සභාව.

2013 අප්‍රේල් මස 20 වැනි දින,
වැලිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

05-327

---

# අයවැය ලේඛන

**මීගමුව මහ නගර සභාව**

2013 වර්ෂයේ අංක 01 පරිපූරක අය වැය ලේඛනය

මීගමුව මහ නගර සභාවේ 2013.05.09 දින පැවැත්වීමට නියමිත මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීම සඳහා 2013 වර්ෂයේ අංක 01 දරන පරිපූරක අයවැය ලේඛනය 2013.05.01 වැනි දින සිට දින 07ක් මහජන පරීක්ෂණය සඳහා මෙම කාර්යාලයේ ප්‍රදර්ශනයට තබා ඇති බව 252 අධිකාරය මහ නගර සභා ආඥා පනතේ 214(ආ) යටතේ දැනුම් දෙමි.

ඇන්ටනී ජයවීර,
නගරාධිපති,
මහ නගර සභාව, මීගමුව.

මීගමුව මහ නගර සභා කාර්යාලයේ දී ය.
05-360

# විවිධ දැන්වීම්

## ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දුරකථන හා සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීමේදී 2013 වර්ෂය සඳහා පහත සඳහන් පරිදි ගාස්තු අයකිරීම සුදුසු බවට 2013 මාර්තු 12 වන දින පැවැති ගරු මහ සභාවේදී සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. පී. ගුණරත්න රාජපක්ෂ,
සභාපති,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2013 මාර්තු මස 13 වැනි දින,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

**දුරකථන කුළුණු/ ඇන්ටෙනා කුළුණු/විදුලි සංදේශ කුළුණු ඉදිකිරීම සඳහා ගාස්තු අයකිරීම**

| | | | |
|---|---|---|---|
| 1. | සංවර්ධන අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා | - | උස මීටර 5-20 දක්වා රු. 20,000 ක් සහ වැඩිවන සෑම මීටර් එකකට රු. 100 බැගින් |
| 2. | අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා | - | උස මීටර 5-20 දක්වා රු. 2000 ක් සහ වැඩිවන සෑම මීටර් එකකට රු. 100 බැගින් |
| 3. | නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ඉදිකිරීම/ නැවත ඉදිකිරීම/කොටස් එකතු කිරීම සඳහා | - | උස සෑම මීටර් 5කට රු. 10,000 බැගින් |
| 4. | ස්ථාපිත කර ඇති දුරකථන කුළුණු/ඇන්ටනා කුළුණු ඉදිකිරීම/විදුලි සංදේශ කුළුණු සඳහා වාර්ෂිකව ගෙවිය යුතු ගාස්තුව | - | රු. 50,000 0 |

05-449

---

## කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව

2013 වර්ෂයට සේවා සැපයීමේ දී අයකරනු ලබන ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2012 වර්ෂයෙහි ඔක්තෝබර් මස 26 වැනි දින, පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

සභාපති,
කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.

2012 වර්ෂයෙහි ඔක්තෝබර් මස 26 වැනි දින,
ගොතටුව නව නගරය,
කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ දී ය.

**ඉහත කී යෝජනාව**

කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ 2013 වර්ෂයේ ජනවාරි 01 වැනි දින සිට 2013 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් පරිදි ගාස්තු අයකරනු ලබන බව දැනුම් දෙමි.

***ඉහත කී උපලේඛනය***

| | | රු. |
|---|---|---|
| 1. | ඔප්පු සාරාංශ අයදුම්පත් | 300 0 |
| 2. | අමතර වරිපනම් දැන්වීමක් | 50 0 |
| 3. | නොපවරාගැනීම්, වීථිරේඛා ගොඩනැගිලි සීමා හා අයිතිය පිළිබඳ සහතිකයක් | 350 0 |
| 4. | වරිපනම් උධෘත සඳහා වර්ෂයකට | 100 0 |
| 5. | ගොඩනැගිලි/ඉඩම් අනු බෙදුම් අයදුම්පතක් | 500 0 |
| 6. | අනුකූලතා සහතික අයදුම්පතක් | 500 0 |

| | | රු. |
|---|---|---|
| 7. | සංගීත සංදර්ශන/අවසරලත් සැණකෙළි සඳහා | 1,000 0 |
| 8. | අංගොඩ ටී. බී. ඉලංගරත්න ක්‍රීඩාපිටිය වෙන් කිරීම | |
| (අ) | සමිති ක්‍රීඩා සමාජවලට - | |
| | බල ප්‍රදේශය තුළ | 2,000 0 |
| | බල ප්‍රදේශයෙන් පිටත | 3,000 0 |
| (ආ) | රජයේ පාසල් සඳහා - | |
| | බල ප්‍රදේශය තුළ | නොමිලේ |
| | බල ප්‍රදේශයෙන් පිටත | 3,000 0 |
| (ඇ) | ආයතන/පෞද්ගලික පාසල් සඳහා | 10,000 0 |
| (ඈ) | වතුර ටැංකි 1ක් සඳහා දිනකට | 750 0 |
| (ඉ) | කොඩි කණුවක් සඳහා | 50 0 |
| (ඊ) | පුටුවක් සඳහා | 25 0 |
| (උ) | ඉහත කුමන හෝ අවස්ථාවක දී ක්‍රීඩාංගණයට සිදුවිය හැකි අලාභ අය කර ගැනීමට, ක්‍රීඩාංගණය වෙන් කරවා ගන්නා අවස්ථාවේ දී ගෙවිය යුතු ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පත් මුදල | 5,000 0 |
| 9. | ව්‍යාපාරික ස්ථානයක කසළ බැහැර කිරීම (ට්‍රැක්ටර් 1කට) | |
| (අ) | අපද්‍රව්‍ය වෙන්කිරීමක් නොමැතිව භාරදෙන විටෙක | 1,500 0 |
| (ආ) | දිරන අපද්‍රව්‍ය වෙනමත් නොදිරන අපද්‍රව්‍ය වෙනමත් වෙන්කර භාරදෙන විටක | 1,.000 0 |
| 10. | ලීටර් 3500 ගලි බවුසරයේ සේවාව සැපයීම බල ප්‍රදේශය ඇතුලත (එක් ගමන් වාරයකට) | |
| (අ) | නේවාසික ස්ථාන | 3,500 0 |
| (ආ) | ව්‍යාපාරික ස්ථාන හෝ රාජ්‍ය ආයතන | 4,500 0 |
| (ඇ) | ගලි බවුසර් සේවාව සැපයීම සඳහා යම් ස්ථානයකට ගමන් කිරීමෙන් පසුව යම් හෙයකින් සේවාව සැපයීමට නොහැකි වුවහොත් අය කරන ලද ගාස්තුවෙන් රු. 1,050ක් සහාවට අයකරගෙන ඉතිරිය ආපසු ගෙවනු ලැබේ. | |
| 11. | ලීටර් 3,500 ගලි බවුසරයේ සේවාව සැපයීම බල ප්‍රදේශය පිටත (එක් ගමන් වාරයකට) | |
| (අ) | නේවාසික ස්ථාන | 4,000 0 |
| (ආ) | ව්‍යාපාරික ස්ථාන හෝ රාජ්‍ය ආයතන | 5,000 0 |
| (ඇ) | ගලිබවුසර් සේවාව සැපයීම සඳහා යම් ස්ථානයකට ගමන් කිරීමෙන් පසුව යම් හෙයකින් සේවාව සැපයීමට නොහැකි වුවහොත් අයකරන ලද ගාස්තුවෙන් රු. 1,200ක් සහාවට අයකරගෙන ඉතිරිය ආපසු ගෙවනු ලැබේ. | |

ඉහත ගාස්තුවලට (ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පතු හැර) අමතරව එකතු කළ අගය මත බදු මුදල් හා ජාතිය ගොඩනැගීමේ බදු මුදල් ගෙවිය යුතුයි.

| | | රු. |
|---|---|---|
| 8. | මෘත දේහයක් භූමදානය සඳහා | 100 0 |
| 9. | මෘත දේහයක් ආදාහනය සඳහා | 500 0 |
| 10. | මෘත දේහයක් ආදාහනාගාරයේ ආදාහනය සඳහා (බල ප්‍රදේශය තුළ) | 3,500 0 |
| 11. | මෘත දේහයක් ආදාහනාගාරයේ ආදාහනය සඳහා (බල ප්‍රදේශයෙන් බැහැර) | 4,000 0 |
| 12. | ආදාහනාගාරයක් සහිත සුසාන භූමියක සිහිවටන ඵලකයක් ඉදිකිරීම සඳහා ස්ථාවර ගාස්තුව | 11,000 0 |
| 13. | පුස්තකාල සාමාජික අයදුම්පතක් | 10 0 |
| 14. | පුස්තකාල සාමාජික ගාස්තු | |
| | වැඩිහිටි | 100 0 |
| | ළමා | 50 0 |
| 15. | පුස්තකාල සාමාජිකත්වය අළුත් කිරීමේ ගාස්තු | |
| | වැඩිහිටි | 50 0 |
| | ළමා | 25 0 |
| 16. | පුස්තකාල පොතක ප්‍රමාද ගාස්තුව (දිනකට) | 2 0 |

05-383

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.